යම් කිසි ප්‍රවෘත්ති වාර්තාවක් පළ කිරීමේදී, එහි අඩංගු කරුණු වලට පදනම් වූ මූලාශ්‍ර හෙළිකිරීමට මූලාශ්‍රයෙන් අවසරයක් නොලැබෙන අවස්ථාවකදී, මූලාශ්‍රයේ අනන්‍යතාවය මාධ්‍යවේදියා විසින් ආරක්ෂා කළ යුතු බවට විවාදයක් නොමැත. නමුත් එවන් අවස්ථාවකදී පවා තමන් ඉදිරිපත් කරන කරුණු කාරණා ඔප්පු කිරීමට සාක්ෂි සාධක මාධ්‍යවේදියා සතුව තිබිය යුතු වේ.
"2018 වසරේදී... ඇමරිකානු හමුදාවේ හිටපු නිලධාරීන් හොර පාරෙන් ලංකාවට පැන්නේ අධිකරණ අමාත්‍යාංශයත් දැනුවත්ව" යන සිරස්තලයෙන් යුතුව අරුණ පුවත්පතේ (06/08) පළවූ ලිපියේ කිසිදු විශ්වසනීය මූලාශ්‍රයක් පළවී නොතිබුණි. එසේ නම්, සඳහන් නොකළද එම තොරතුරු සඳහා නිසි මූලාශ්‍ර පදනමක් තිබේද, එවැනි මූලාශ්‍ර පදනමක් නොමැත්තේ නම්, එය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවන්නේද යන පැනයන් පාඨක අප විසින් නැගිය යුතු වේ.
මූලාශ්‍ර සඳහන් කිරීම සම්බන්ධයෙන් වන මූලාශ්‍ර:
https://ethics.journalists.org/topics/confidential-sources/
https://www.ap.org/.../telling-the-story/anonymous-sources
#MediaEthicsSL #lka #SinhalaNews #Aruna